# බොල් විදග්ධ සංස්කෘතිය හා ආතර් සී ක්ලාක්

මෙරට නව සිංහල විදග්ධ සංස්කෘතියක් ගොඩනගා ගැනීමට පෙර දැරූවන්ට විශ්ව විද්‍යාල ආයතනයේ හා පසුව විශ්ව විද්‍යාලයේ පෙරදිග අධ්‍යයන පීඨයෙන් හිමි වූ හීනමානය යම් බලපෑමක් කර ඇති බව පැහැදිලි ය. බටහිර චින්තන ආධිපත්‍යයට යට වූ ඔවුන්ට යම් ප්‍රමාණයකට හෝ අභිමානයක් ලබා දුන්නේ භාරතීය සංස්කෘතියයි. එය ද භාරතීය පඬුවන්ගේ, විශේෂයෙන් ම ඨාගෝර් තුමාගේ ආභාසයෙන් ලැබුණු එකක් විය. කලින් කියා ඇති පරිදි බටහිර චින්තන ආධිපත්‍යයට ගොදුරු වූ භාරතීය පඬුවන්ට ද බටහිර සංස්කෘතිකාංග භාරතීය සංස්කෘතියට අවශෝෂණය කරන්නේ කෙසේ ද යන්න පිළිබඳ අදහසක් හෝ නොවී ය.

සංගීතය ඉගෙනීමට භාරතයට යැවුණු සිංහලයෝ උත්තර භාරතීය සංගීතය හැදෑරූහ. සමහරු එය හදාරා ඇතැම්විට උතුරු ඉන්දියානු කාන්තාවන් ද විවාහ කරගෙන එහිම පදිංචි වූහ. ඔවුහු භාරතීය සංස්කෘතිකාංග සිංහල සංස්කෘතියට අවශෝෂණය කරනු වෙනුවට එහි බින්න බැස්සෝ ය. එනම් ඔවුහු භාරතීයට සංස්කෘතියට අවශෝෂණය වූහ. තවත් සමහරු ඒ ඉගෙන භාරතීය සංස්කෘතියෙහි නියෝජිතයන් ලෙස මෙරටට පැමිණියහ. ඔවුහු මෙරට උත්තර භාරතීය සංගීතය ඉගැන්වීමෙහි හා එය පැතිරවීමෙහි නිරතවූහ. මොවුන් හා බටහිරට ගොස් බටහිර විද්‍යාව, බටහිර සාහිත්‍යය, බටහිර සංගීතය ආදිය හදාරා එක්කෝ එහි පදිංචි වූවන් හෝ නැත්නම් මෙහි පැමිණ ඒ ඉගැන්වීමෙහි හා ප්‍රචාරය කිරීමෙහි නිරතවූවන් හෝ අතර වෙනසක් නැත.

බටහිර විද්‍යා ආදිය හදාරා මෙහි පැමිණි පිරිස මෙන් ම භාරතීය සංගීතය හදාරා මෙහි පැමිණි පිරිස ද අතර තවත් ආකාරයක සමානත්වයක් ද දැකිය හැකි ය. බොහෝ දෙනකු ආපසු පැමිණ තම තමන්ගේ වැඩක් බලාගෙන සිටි අතර කිහිප දෙනෙක් තම දැනුම ආධාර කරගෙන ජනප්‍රිය වූහ. එතරම් ගැඹුරක් නැති කාර්යයන්හි යෙදුණු මොවුහු ජනප්‍රියවාදීහු වූහ. මේ ක්ෂේත්‍රවල අද මෙරට නමක් ඇති කරගෙන සිටින බොහෝ දෙනා බටහිර විද්‍යා ආදියට හෝ භාරතීය සංගීතයට හෝ කර ඇති සේවයක් නැත.

අමරදේව මහතා මෙන් ම සුනිල් ශාන්ත මහතා හා ආනන්ද සමරකෝන් මහතා ද උතුරු ඉන්දියාවේ සංගීතය ඉගෙන මෙහි පැමිණියෝ වෙති. මෙයින් සුනිල් ශාන්ත මහතාට මෙන් ම ආනන්ද සමරකෝන් මහතාට ද දේශීය සංගීතයක් නිර්මාණය කර මෙරට නව විදග්ධ සංස්කෘතියක් ගොඩ නැගීමට අවශ්‍ය විය. එහෙත් ඔවුන්ට වඩා විදග්ධ සමාජයේ පිළිගැනීමක් වූයේ අමරදේව මහතාට ය. මෙය අප තරමක් විස්තරාත්මක ව හැදෑරිය යුතු වන්නේ අපේ විද්‍යාවක් හා අපේ ප්‍රවාද නිර්මාණය කිරීමේ දී හා විශේෂයෙන් ම ඒ සමාජය ලවා පිළිගැන්වීමට භාජනය කිරීමේ දී සිදුවන ගැටළු ගැන අවබෝධයක් ලබා ගැනීමට ය.

කලින් සඳහන් කර ඇති ආකාරයට මෙරට නව විදග්ධ සංස්කෘතියක් ගොඩ නැගීමේ කාර්යය භාර ගත්තේ විශ්ව විද්‍යාල ආයතනයේ පෙරදිග අධ්‍යයන පීඨය ය. එය ඉබේට හෝ ඒ පීඨයෙහි වූවන්ගේ විශේෂ දක්ෂතාවයක් නිසා භාර දුන් කාර්යයක් නොවේ. එය ඒ ආයතනයට ලැබුණේ විශ්ව විද්‍යාල ආයතනය බ්‍රිතානි යටත්විජිතවාදය විසින් බිහි කරනු ලැබීම හේතු කොටගෙන ය. පිරිවෙන්වල එයට වඩා දක්ෂයන් සිටින්නට ඇති නමුත් පිළිගැනීමක් තිබුණේ විශ්ව විද්‍යාල ආයතනයට ය. නව විදග්ධ සංස්කෘතියෙහි මිනුම් දඬු, සම්මත ආදිය සකස් කිරීම පෙරදිග අධ්‍යයන පීඨයට භාර විය. ඒ ආයතනයෙන් බිහි කරනු ලැබුවෝ විවිධ තනතුරු දරමින් සමාජය පිරිවසා ආධිපත්‍යයක් ඇති කර ගත්හ.

එවකට තිබූ ගුවන් විදුලි සේවයෙහි සංගීතඥයන් වර්ග කිරීම සඳහා ඉන්දියාවෙන් සංගීතඥයකු ගෙන්වා ගනු ලැබුයේ මේ වකවානුවෙහි දී ය. පෙරදිග අධ්‍යයන පීඨයෙහි ඉන්දු ආර්ය භාෂා හැදෑරූවෝ එලෙස ඉන්දියානුවකු ගෙන්වා ගැනීමට මුල් වූහ. සුනිල් ශාන්ත මහතා ප්‍රතිපත්තියක් මත පිහිටා ඉන්දියානු සංගීතඥයා හමුවෙහි පෙනී නොසිටියේ ය. එහි අවසන් ප්‍රතිඵලය වූයේ ඒ මහතා ගුවන් විදුලියෙන් කැපී යෑම ය. සංගීත පරීක්ෂණයට පෙනී සිටි අමරදේව මහතා ක්‍රමයෙන් ඉදිරියට පැමිණියේ ය. ඔහු ඉදිරිපත් කළ සංගීතය පිළි ගැනීම සඳහා යම් විදග්ධ පිරිසක් මේ වන විට පෙරදිග අධ්‍යයන පීඨය විසින් ඇති කර ලැබ තිබුණි.

© Prof. Nalin De Silva

මෙයින් පැහැදිලි විය යුතු කරුණ නම් අමරදේව මහතා යනු හුදෙක් ඔහුගේ දක්ෂතාවයෙහි ප්‍රතිඵලයක් නොවන බව ය. අමරදේව මහතාගේ බිහිවීම සඳහා කරුණු කිහිපයක් සම්පූර්ණ කළ යුතුව තිබුණි. බටහිර ශාස්ත්‍රීය ආධිපත්‍යයට යට වූ පිරිසක් සිටීම ප්‍රධාන කරුණක් විය. දෙවනුව නව විදග්ධ සංස්කෘතිය බිහි කිරීමේ කාර්යය භාර කර දුන් පෙරදිග අධ්‍යයන පීඨයට මෙරට සංගීතය ආදී කලාවන් සම්බන්ධයෙන් තිබුනේ ඒ ඊනියා ඉන්දියානු මහා සම්ප්‍රදායේ චූල සම්ප්‍රදාය විය යුතු ය යන අදහස ය. (මහා සම්ප්‍රදාය හා චූල සම්ප්‍රදාය පිළිබඳ අදහස් එවකට මෙරට පාඨකයනට හඳුන්වා දී තිබුණි ද යන්න එතරම් ප්‍රශ්නයක් නොවේ. ඒ හෝ එයට සමීප අදහස් බටහිර ශාස්ත්‍රීය ආධිපත්‍යයට යට වී සිටි පිරිස පිළිගත්හ.) තුන්වනුව විද්‍යෝදය හා විද්‍යාලංකාර පිරිවෙන් නව දැනුමක් නිර්මාණය කිරීමට නොවෙහෙසිණි. පැරණි දැනුම නව ශිෂ්‍යයන්ට ඉගැන්වීම ඔවුන්ගේ කාර්යය විය. ඒ අනුව ඊනියා නව දැනුම, එනම් බටහිර දැනුම හඳුන්වා දීම විශ්ව විද්‍යාල ආයතනයට හා පසුව විශ්ව විද්‍යාලයට පැවරිණි. හතරවනුව පෙරදිග අධ්‍යයන පීඨය විසින් බිහි කරනු ලැබුවෝ විවිධ බලාධිකාරිවල (ගුවන් විදුලිය එක් ප්‍රධාන ආයතනයක් විය.) හා විශේෂයෙන් ම පාසල්වල ගුරුවරුන් ලෙස සේවය කළහ. මේ අය අළුතින් බිහි කළ විදග්ධ පිරිසක් බවට පත්වූහ. විදග්ධ සංස්කෘතියෙහි මිනුම් දඬු ඔවුන් සතු වූ අතර ඔවුහු විදග්ධ සංස්කෘතිය කුමක්දැයි නිර්ණය කළහ. ඔවුන් හරහා පිරිසක්, විශේෂයෙන් ම පාසල් සිසුන්ගෙන් කොටසක් මේ විදග්ධ සමාජයට ඇතුල් කර ගනු ලැබූහ. අමරදේව සංගිතය රස විඳීමට පිරිසක් පුහුණු කරනු ලැබ සිටියහ. මේ සියළු කරුණු සම්පූර්ණ නොවන්නට අමරදේව මහතා බිහි නොවනු ඇත.

අමරදේව මහතාගේ සංගීතය සම්භාව්‍ය උත්තර භාරතීය සංගීතය නොවුණ ද, එය විදග්ධ සංගීතයක් ලෙස හඳුන්වා දෙනු ලැබිණි. මාර්ටින් වික්‍රමසිංහ මහතා හඳුන්වා දීමෙහි දී මෙන් ම මෙහි දී ද සරච්චන්ද්‍ර මහතා ඇතුළු පෙරදිග අධ්‍යයන පීඨයෙහි අධිපතිවාදී බලය ප්‍රධාන කාර්යභාරය ඉටුකෙළේ ය. මේ අධිපතිවාදය විසින් බිහි කරනු ලැබූ නව විදග්ධ සිංහල සංස්කෘතිය අද වන විට පුස්සක් බවට පත්වෙමින් ඇත. ජනප්‍රිය සංස්කෘතිය නමින් අද පැතිරෙන රැල්ලට මුහුණ දී ගත නොහැකි ව අද මේ බොල් විදග්ධ සංස්කෘතිය පරාජය වී පලා යනු දැක ගත හැකි ය. ඇතැම් ඉලෙක්ට්‍රොනික මාධ්‍ය ඔස්සේ හරසුන් වදන් දොඩන කසිකබල් නිවේදක නිවේදිකාවනට පැර දී ඊනියා විදග්ධ නිවේදික නිවේදිකාවන් පළා යෑම අද ප්‍රශ්නයක් වී ඇත. අප හරවත් සම්භාව්‍ය සංස්කෘතියක් බිහි කරගෙන තිබුණි නම් ඊනියා ජනප්‍රිය සංස්කෘතියට මුහුණ දීම ගැටළුවක් නොවීමට තිබුණි. බටහිර රටවල ද ඊනියා ජනප්‍රිය සංස්කෘතියක් පැතිර ගොස් ඇත. (මෙරට ඇත්තේ බටහිර ඊනියා ජනප්‍රිය සංස්කෘතියෙහි අනුකරණයක් පමණකි.) එහෙත් බටහිර සම්භාව්‍ය සංස්කෘතියට එය අපට මෙන් ප්‍රශ්නයක් නොවේ. ඉන්දියාවෙහි සම්භාව්‍ය සංගීතය උගත්තෝ එහි ජනප්‍රිය සිනමා සංගීතයෙන් කැළඹීමට පත් නොවෙති. කිසි දිනෙක ජනප්‍රිය සිනමා සංගීතයට ඉන්දියාවේ සම්භාව්‍ය සංගීතයට අභියෝග කළ හැකි නොවේ. සංගීතය යනු සංස්කෘතියෙහි එක් අංගයක් පමණකි.

එහෙත් සිංහල විදග්ධ සංස්කෘතියට ඊනියා ජනප්‍රිය සංස්කෘතියට මුහුණ දී ගත නොහැකි විය. එයට ප්‍රධාන හේතුවක් වෙයි. මෙරට ගොඩ නැගූ ඊනියා නව විදග්ධ සංස්කෘතිය ද ජනප්‍රියවාදී සංස්කෘතියක් වීම ය. එහි හරවත් න්‍යෂ්ටියක් නොවී ය. නව විදග්ධ සංස්කෘතිය ගොඩ නැංවූවනට හරවත් න්‍යෂ්ටිය සොයා යෑමේ අවශ්‍යතාවයක් ද නොවිණි. අපේ හරවත් න්‍යෂ්ටිය ඇත්තේ බෞද්ධ දර්ශනය තුළ ය. භාරතීය සම්භාව්‍ය සංස්කෘතිය හා වෛදික දර්ශනය අතර ඇති සම්බන්ධය ගැන සිතා බැලීමෙන් අප කෙතරම් නොමග ගොස් ඇත් ද යන්න පැහැදිලි වෙයි. බටහිර ශාස්ත්‍රීය ආධිපත්‍යයෙන් මිදී බෞද්ධ දර්ශනය හැදෑරීමට මහන්සි ගත්තෝ පෙරදිග අධ්‍යයන පීඨයෙහි නොවූහ. අද මහත් ඉහළින් පිළිගැනෙන, බෞද්ධ අධ්‍යයනවල නිරත වූවන්ට අවශ්‍ය වූයේ බෞද්ධ දර්ශනය බටහිර දර්ශනයට සමාන බව පෙන්වීම ය. මාර්ටින් වික්‍රමසිංහ මහතාට අවශ්‍ය වූයේ ජාතක කතා බටහිර යථාර්ථවාදී කෙටිකතාවට සමීප බව පෙන්වීමට ය. කෙසේ වුවත් මේ සියල්ල පිළිගැනීමට සූදානම් වූ පිරිසක් බටහිර ශාස්ත්‍රීය ආධිපත්‍යය යටතේ පෙරදිග අධ්‍යයන පීඨය විසින් විශ්ව විද්‍යාලවල හා පාසල්වල බිහි කර තිබුණි.

මේ තත්වය මෙරට බටහිර විද්‍යා අධ්‍යාපනය සමග සසඳා බලමු. කොළඹ වෛද්‍ය විද්‍යාලය ආරම්භ කර ඇත්තේ 1870 වසරේදී ය. එය මුලින්ම ආරම්භ කර ඇත්තේ මෙරට සිටි සුදු ජාතිකයන්ට, විශේෂයෙන් ම හමුදා භටයන්ට ප්‍රතිකාර කිරීම සඳහා මෙරටින් ම පිරිසක් බිහි කර ගැනීමට ය. එංගලන්තයේ සිට වෛද්‍යවරුන් ගෙන්වනවාට වඩා ලංකාවේ ඇපොතිකරි මට්ටමේ පිරිසක් බිහිකර ගැනීම ලාභදායක යැයි බ්‍රිතානි පාලකයෝ සිතූහ. මුල් බටහිර

© Prof. Nalin De Silva

වෛද්‍යවරු බොහෝ දෙනා බර්ගර් ජන වර්ගයට අයත්වූහ. පාසල්වල බටහිර විද්‍යාව උගන්වන්නට පටන්ගෙන දැනට වසර එකසිය විසිපහකට වඩා වැඩි ය. එහෙත් අද වන තුරු බටහිර විද්‍යාවේ සංකල්ප, ප්‍රවාද කීයක් අප විසින් බිහි කරනු ලැබ ඇත් ද? අඩුම තරමින් ලංඩනයේ රාජකීය සංගමයේ අධි සාමාජිකයකු (එෆ්. ආර්. එස්.-ෆෙලෝ ඔෆ් ද රෝයල් සොසයිටි, ලංඩන්) බිහි කර ගැනීමට අපට නොහැකි වී ඇත. මා ඒ බව සඳහන් කෙළේ ඒ අධි සාමාජිකත්වය ලබා ගත යුතු යැයි මා සිතන නිසා නොවේ. මෙරට බටහිර විද්‍යාඥයෝ එවැනි සම්මාන ගැන උනන්දුවක් දක්වති. ඔවුන්ගේ සමාජයෙහි උසස් යැයි සම්මත සම්මානයක් ලබා ගැනීමට ඔවුන් කිසිවකුටවත් මෙතෙක් නොහැකි වී ඇත.

මෙයට හේතු ගණනාවක් වෙයි. ඒ සියල්ල සාකච්ඡා කිරීමට මම බලාපොරොත්තු නොවෙමි. එහෙත් කරුණු කිහිපයක් විටින් විට හෝ සඳහන් කළ යුතු ය. අපි අපේ විද්‍යාවක් ගොඩ නැගීමට කිසිමදාක උත්සාහ නොකිරීම ප්‍රධානම කරුණ වෙයි. අපේ විද්‍යවක් කී පමණින් සිනහසෙන්නෝ සිටිති. ඔවුන්ගේ නොදැනුම පසෙක ලා බටහිර විද්‍යාවට හෝ යම් වැදගත් එකතුවක් කිරීමට හැකි අය බිහි නොවුණේ ඇයි ද යන්න පළමුව සාකච්ඡා කරමු. පළමුව බටහිර විද්‍යාඥයා යන සංකල්පයවත් අපි හරිහැටි නොදන්නෙමු. බොහෝ දෙනා සිතන පතන ආකාරයට ආතර් සී ක්ලාක් මහතා ශ්‍රේෂ්ට බටහිර විද්‍යඥයෙක් වෙයි. එහෙත් මෙය වැරදි ය. ක්ලාක් මහතා විශිෂ්ට ගණයේ බටහිර විද්‍යා ප්‍රබන්ධ කරුවෙක් වෙයි. ඔහු යම් යම් අනාවැකි පළ කර ඇත. මේ ඇතැම් අනාවැකි එල දරා ඇත. එහෙත් එපමණකින් ආතර් සී ක්ලාක් මහතා ඉහළ ගණයේ තබා කිසිම ගණයක බටහිර විද්‍යාඥයෙක් නොවෙයි. මෙරට සිටින බටහිර විද්‍යාව හැදෑරූ හා උගන්වන විශාල පිරිසක් ඒ බව දනිති. එහෙත් එය ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමට ඔවුහු මැළිවෙති. එසේ කිරීමෙන් තමන්ට සමාජයේ තිබෙන තැන නැතිවේවි යැයි ඔවුහු සිතති. අධිපතිවාදවල බලය ඒ කරුණින් ම පෙනී යා යුතු ය. බටහිර විද්‍යාඥයා කවුද බටහිර විද්‍යා ප්‍රබන්ධ ලේඛකයා කවුද යනුවෙන් හඳුනාගත නොහැකි නම් ඉන් කියැවෙන්නේ කුමක් ද?

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva